ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත 11 ක් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.5,148,063 ක් අඩුවෙන් දැක්වුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද පිරිවැය රු.3,308,050 ක් වූ වාහන 03 කට අදාළව වෙන්දේසි ආදායම වූ රු.4,905,000 ක් වත්කම් ගිණුමෙන් ඉවත් කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.1,596,950 ක් අඩුවෙන් දැක්වුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද පිරිවැය රු.675,000 ක් වූ තලන යන්ත්‍රයේ පිරිවැය වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-

(ඈ)	සමාලෝචිත වර්ෂ අවසානයට ඉතිරි තොගය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් සහ වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,354,056 ක් අඩුවෙන් දැක්වුණි.	භාණ්ඩ මිලදී ගැනීමේදී මුළු පිරිවැය ආදායම් වියදම් ගිණුමට ගිණුම්ගත කරන බැවින් තොග ගිණුම් පවත්වාගෙන යාමක් මෙතෙක් සිදුවී නොමැති බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත ණයහිමියන් රු.801,973 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් ප්‍රාග්ධන වියදම හා ජංගම වගකීම් වැඩියෙන් දැක්වුණි.	ඉදිරියේ දී මෙවැනි වැරදි නොකිරීමටත් සිදුව ඇති දෝෂය නිවැරදි කිරීමටත් කටයුතු කරන බව.	-එම-

1.7 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(5)	1995 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 42 කදී ලබා දී තිබුණු අත්තිකාරම් රු.1,902,321 ක් 2025 අප්‍රේල් වන විටත් පියවා නොතිබුණි.	1995 සිට 2009 වර්ෂය දක්වා වන නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීමට කමිටුවක් පත්කර ඇති අතර ඉතිරි අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,594,336 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,583,957 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	9,381,000	9,990,450	12,480,302	21,969,309	10,029,000	9,479,891	11,816,631	24,400,450
කුලී	10,935,100	13,062,416	13,581,250	766,807	11,652,500	12,285,671	12,088,896	1,313,907
බලපත්‍ර ගාස්තු	1,275,100	975,554	975,554	1,000	1,257,600	936,780	936,780	1,000
වෙනත් ආදායම්	10,364,500	13,582,427	19,491,899	1,211,930	9,926,100	11,043,888	9,332,714	3,258,189
	31,955,700	37,610,847	46,529,005	23,949,046	32,865,200	33,746,230	34,175,021	28,973,546

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.21,658,948 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.17,406,811 ක් වූ වරිපනම් ඒකක 2,332 ක් ඇතුළත් වී තිබුණි.	වසර 05 ට වැඩි හිඟ පවතින වරිපනම් දේපල සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.195,701 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 126 කින් අයවිය යුතු රු.153,110 ක් ඇතුළත් වී තිබුණි.	අවුරුදු 05 ට වඩා පැරණි හිඟ අක්කර බදුවලින් රු.13,556 ක් 2025 මාර්තු වන විට අයකරගෙන ඇති බව.	හිඟ අක්කර බදු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ජල පාරිභෝගිකයින් 57 ක ගෙන් ඉකුත් වර්ෂයට අදාළ හිඟ ජල ගාස්තු රු.65,760 ක් 2025 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා ජල පාරිභෝගිකයින්ට ලිපි මඟින් දැනුම් දී ඇති බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ගාස්තු අය කළ යුතු තාවකාලික දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. එමෙන්ම, ඉකුත් වර්ෂවලදී හඳුනාගන්නා ලද ස්ථිර දැන්වීම් පුවරු 06 ක් සඳහා අයවිය යුතු එකතුව රු.45,000 ක් 2025 අප්‍රේල් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 වසර සඳහා මුදල් ගෙවා නොමැති දැන්වීම් පුවරු සඳහා මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් ලිපි මඟින් දැනුවත් කරන ලද බව හා මුදල් නොගෙවීම නිසා එම දැන්වීම් පුවරු කපා ඉවත් කරන ලද බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**අතුරු ව්‍යවස්ථා**		
	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28 ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභාව පිහිටුවීමෙන් පසු අවශ්‍යතාවය මත අනෙකුත් අතුරු ව්‍යස්ථා සකස් කර ගැනීමට බලාපොරොත්තු වන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

බේරුවාන කසළ අංගනය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. තවද, නිපදවන කොම්පෝස්ට් පොහොර සඳහා තත්ත්ව සහතිකයක් ලබා ගැනීමට 2021 සැප්තැම්බර් 23 දිනැතිව ඉදිරිපත් කරන ලද පොහොර සාම්පලය ද තත්ත්වයෙන් අසමත් වී තිබුණි. කොම්පෝස්ට් පොහොර සඳහා වෙළඳපොලක් නිර්මාණය කිරීමේ අරමුණෙන් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීමට උපදෙස් දී තිබුණ ද, 2025 අප්‍රේල් වන විටත් ලියාපදිංචි වී නොතිබුණු අතර, පොහොර නිෂ්පාදන හා අලෙවි වාර්තා අනුව නිෂ්පාදනය කරන පොහොරවලින් සියයට 95 ක ප්‍රමාණයක් අලෙවි කර ගත නොහැකි වී තිබුණි.	කසළ මධ්‍යස්ථානය ක්‍රමවත්වීමෙන් පසු පරිසර බලපත්‍රය ලබා ගැනීමට හැකි වනු ඇති බව. කාබනික පොහොර සඳහා නැවත තත්ත්ව සහතිකයක් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව හා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී පොහොර අලෙවිය වැඩි කර ගැනීමට කටයුතු කරන බව.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය විධිමත්ව සිදුකළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොන්ත්‍රාත් පදනමින් මාර්ග කම්කරුවෙකු ලෙස සභාවේ සේවය කළ අයෙකු 2006 ඔක්තෝබර් 20 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ අර්ථසාධක අරමුදලට දායක නොකිරීම හේතුවෙන් ඔහු විසින් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. නඩුවේ තීරණය අනුව අර්ථසාධක අරමුදල් දායකය හා ඊට අදාළ අධිභාර මුදල ලෙස රු.165,480 ක් ගෙවීමට නියෝග කර තිබුණු අතර, එම මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි. පසුව සභාවේ වගකීම හැර ඉතිරි මුදල වගකිව යුතු පාර්ශවයන් සිව් දෙනෙකුගෙන් අය කර ගැනීමට තීරණය කර තිබුණද, හිටපු සභාපතිවරයෙකුගෙන් අයකර ගතයුතු රු.49,644 ක් 2024 දෙසැම්බර් වන විටත් අය කර ගෙන නොතිබුණි.	හිටපු සභාපති වරයාගෙන් එම රු.49,644 ක මුදල අයකර ගැනිම සඳහා නඩුවක් පැවරීමට සභාවේ නීතිඥ මහතා වෙත යොමුකොට ඇති බව.	අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	එකතුව රු.282,564,909 ක් වූ වත්කම් විෂයයන් 13 ක විස්තරාත්මක උප ලේඛන පිළියෙල කර නොතිබුණි.	උපලේඛන සකස් කිරීමට කටයුතු කරගෙන යන බව.	විස්තරාත්මක උප ලේඛන සකස් කළ යුතුය.
(ඇ)	තැන්පතු ගිණුම් 03 ක පවතින එකතුව රු.8,128,152 ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.	වසර ගණනාවක සිට පැවතගෙන එන හර ශේෂ බැවින් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	අදාළ ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සදර්ලැන්ඩ් වත්ත හරහා ආදාගල දක්වා මාර්ගයේ මැනුම් කටයුතු කිරීම වෙනුවෙන් 2024 මාර්තු 01 දින මිනින්දෝරුවරයෙකු වෙත රු.155,000 ක් ගෙවා තිබුණි. නමුත් මාර්ගය සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීමෙන් 2025 මාර්තු වන විටත් මාර්ගය ගැසට් කිරීමට නොහැකි වී තිබුණි.	සදර්ලැන්ඩ් වත්ත හරහා ආදාගල මාර්ගය පවරා ගැනීම සඳහා තහවුරුවක් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකර ඇති බව හා තොරතුරු ලද පසු ඉදිරි කටයුතු සඳහා යොමුවන බව.	මාර්ගය පවරා ගැනීමේ කටයුතු කාර්යක්ෂම කර මාර්ගය ගැසට් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු, ව්‍යාපාර බදු සහ ව්‍යාපාර බලපත්‍ර අය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	ඉදිරි වර්ෂය සඳහා සමීක්ෂණයක් කිරීමට කටයුතු කරන බව.	වාර්ෂිකව සමීක්ෂණය සිදු කළ යුතුය.

3.4 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය අලුත්වැඩියා කිරීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බැකෝ යන්ත්‍ර හා එක්ස්කැවේටර් යන්ත්‍ර කුලියට ගැනීම සඳහා රු.1,808,584 ක් වැය කර තිබුණි.	2024 වර්ෂයේ අවස්ථා තුනක දී කසළ ගොඩ තල්ලු කිරීම සඳහා වියදම් දැරීමට සිදුවූ බව.	ජේ.සී.බී. යන්ත්‍රය අලුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදව සිදු කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පලීගල අඹතැන්න පාරේ ලීවල අසල සිට මඩුවන්දෙණිය හන්දිය දක්වා තාර යොදා සංවර්ධනය කිරීම 2024 සැප්තැම්බර් 28 දින නිමකර තිබුණ ද, 2025 පෙබරවාරි 25 දින වනවිටත් මාර්ගයේ බොහෝ ස්ථාන කැඩී ගොස් මතුපිට තාර සේදී ABC ගල් නිරාවරණය වී පැවැතීමෙන් තාර යෙදීම සඳහා වැය කර තිබුණු රු.916,305 ක් ආර්ථික නොවූ වියදමක් වී තිබුණි. එමෙන්ම, මෙම කර්මාන්තයේ පැති කාණුව කැපීම සඳහා රු.58,871 ක් වැඩිපුර ගෙවා තිබුණි.	මාර්ගය නැවත පිළිසකර කිරීමට කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති බව හා මෙම කර්මාන්තයේ රඳවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් එමඟින් මෙම කොටස් පිළිසකර කර ගත හැකි බව.	සංවර්ධන ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව නිම කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය.